ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 22 - 2022

---

**1. විගණන මතය**

**1.1** ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 22 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන්ගෙන් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2022 වර්ෂයට අදාළව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22ට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 22 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කිලිවැඩ්ඩි<br>කින්නියා<br>කුරින්චන්කර්නි<br>සේරුවිල<br>තෝප්පූර්<br>එච්චලම්පත්රු<br>මූතූර්<br>කුච්චවේලි | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 1981 ඔක්තෝබර් 16 දිනැති චක්‍රලේඛ අංක 107 හි 04 වැනි වගන්තියට අනුව, ගෘහ භාණ්ඩ හා උපකරණ සඳහා ක්ෂය අනුපාතය සියයට 10 ක හීනවන ශේෂ ක්‍රමය විය යුතුය. කෙසේ වෙතත්, ගොවිජන සේවා කාරක සභා 08 ක් විසින් විවිධ ක්‍රම සහ ක්ෂය අනුපාත යොදාගෙන තිබුණි. මේ නිසා ආදායම මත වියදම රු.393,210 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළ ගෘහ භාණ්ඩ හා උපකරණ සඳහා නිවැරදිව ක්ෂයවීම් ගණනය කර ඇති බව සහතික කිරීමට ක්‍රියා කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | නිලාවේලි<br>කින්නියා<br>කුරින්චන්කර්නි<br>සේරුවිල | ප්‍රතිලාභීන් වෙත සහනදායී මිල ගණන් යටතේ රෝද දෙකේ ට්‍රැක්ටර් බෙදා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ රු.1,159,150 හර ශේෂය මූල්‍ය ප්‍රකාශන | එය ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන මගින් හෙළි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මගින් හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඇ) | සේරුවිල එච්චලම්පත්රු නිලාවෙලි | 2020 සහ 2021 වසරවල සභා මගින් නිෂ්පාදනය කරන ලද එකතුව රු.305,096 ක වටිනාකමකින් යුත් කාබනික පොහොර, අලෙවිය සඳහා ඇසුරුම් නොකර නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | කොමසාරිස්වරයාගේ උපදෙස් මත පියවර ගනු ලැබේ. | කාබනික පොහොර නිසි ලෙස ඇසුරුම් කර අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | එච්චලම්පත්තු | 2021 වර්ෂයේදී ඉදිකරන ලද රු.2,842,453 ක වටිනාකමින් යුත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රාග්ධනීතකර නොතිබුණි. | ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණයේ වටිනාකම ජංගම නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදි කරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කුච්චවෙලි මුන්නම්පොඩිවෙඩ්ඩායි පුල්මුඩෙයි ගෝමරන්කඩුවෙල | ගොවිජන කාරක සභා සතු ගොඩනැගිලි සහ ගෘහභාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | එකී ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කුච්චවේලි | එකතුව රු.105,330ක් වටිනා කාබනික පොහොර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වටිනාකම තීරණය කර ඉදිරියේදී එය ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ආරම්භක සහ අවසාන තොග නිසි ලෙස අගයකර ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |
| (උ) | කුච්චවේලි පුල්මුඩෙයි | CSIAP පරිත්‍යාගශීලීන්ගේ සංවිධානයෙන් පරිත්‍යාග ලෙස ගොවිජන සංවර්ධන සභා සඳහා ලැබුණු වගා යන්ත්‍ර හතරක් තක්සේරු කර නොතිබූ අතර ඒවායේ වටිනාකම ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | වටිනාකම තීරණය කර ඉදිරියේදී එය ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | CSIAP විසින් සපයනු ලැබූ යන්ත්‍රෝපකරණ සඳහා වන වටිනාකම තීරණය කර එය ගිණුම්වල හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඌ) | කුරින්චන්කර්නි | පොහොර මිලදී ගැනීම්හි එකතුව වූ රු.22,041,100 ක් මූල්‍ය ප්‍රකාශනයේ රු.69,244,400 ක් ලෙස දක්වා තිබුණි. | 2023 ජනවාරි සහ පෙබරවාරි ශේෂය රු.47,703,300 ක් ආපසු ලබා දී ඇත. | පොහොර අලෙවිය නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | කුරින්වන්කර්නි | මුළු වටිනාකම රු.668,000 ක් වන වාන්-ඇල ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් සපයන ලද යූරියා පොහොර කිලෝග්‍රෑම් 3,340 ක්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ පොහොර ගොවීන් වෙත සෘජුවම බෙදා දෙන ලදී. | තොග වටිනාකමට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | මුල්ලිපොතානෙයි<br>එච්චලම්පත්රු<br>කිලිවැඩ්ඩි<br>මුන්නම්පොඩිවෙඩ්ඩායි<br>තම්පලකාමම් | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පරිත්‍යාග කරන ලද රු.2,724,500ක ෂටර් යන්ත්‍ර 05 සඳහා ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මෙම වරද නිවැරදි කිරීමට ක්‍රියා කරනු ලැබේ. | මෙම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට ගත යුතුය. |
| (ඔ) | සේරුවිල | ලංකා කෘෂි රසායන පොහොර අලෙවි මධ්‍යස්ථානයෙන් මිලදී ගත් රු.707,157 ක් වටිනා රසායනික පොහොර සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | තොග ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රසායනික පොහොරවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඕ) | තම්පලකාමම් | යූරියා පොහොර මුදලට අලෙවිය රු.2,756,474,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.55,129,480 ක් ලෙස දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (ක) | තම්පලකාමම් | යූරියා පොහොර මිලදී ගැනුම් එකතුව රු.30,490,000ක් මූල්‍ය ප්‍රකාශනවල රු.3,031,000,000 ක් ලෙස දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (ග) | උප්පුවේලි | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,565,365 ක ප්‍රාග්ධන කටයුතු 3ක් නිම කරන ලදී. කෙසේ වෙතත්, එය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | එම දෝෂය නිවැරදි කර නිසි ආකාරයෙන් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වත්කම් මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ච) | ගෝමරන්කඩුවෙල | තොග සත්‍යාපන වාර්තාව සහ පොහොර තොග පොත අතර යූරියා පොහොර කිලෝග්‍රෑම් 4,620ට අදාළව රු.924,000ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම්කරණ ලිපිලේඛන බලයලත් නිලධාරියා විසින් පද්ධතිගත කරනු ලබන අතර, ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනස සොයා බලා ඒ අනුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | සභාව / සභා | අයිතම | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | කිලිවෙඩ්ඩි<br>කින්නියා<br>කුච්චවේලි<br>මුල්ලිපොතාන<br>කුරින්චන්කර්නි<br>මූතූර්<br>නිලාවේලි<br>සාම්පූර්<br>සේරුවිල<br>තම්පලකාමම්<br>තෝප්පූර්<br>උප්පුවේලි<br>එච්චලම්පත්රු<br>ගෝමරන්කඩුවෙල<br>මුන්නම්පොඩිවෙඩ්ඩායි<br>පුල්මුඩෙයි | ලැබිය යුතු ශේෂ | 38,328,518 | ණය ගැති ශේෂ තහවුරු කිරීම්, ලිපි, ණයගැති ලේඛනයන් තහවුරු කිරීම්. | සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතියෙන් පසු පියවර ගනු ලැබේ. | යාවත්කාලීනව ලේඛන නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කිලිවෙඩ්ඩි<br>කින්නියා<br>කුච්චවේලි<br>මුල්ලිපොතාන<br>කුරින්චන්කර්නි<br>මූතූර්<br>නිලාවේලි<br>සාම්පූර්<br>සේරුවිල<br>තම්පලකාමම්<br>තෝපූර්<br>උප්පුවේලි<br>එච්චලම්පත්රු | ගෙවිය යුතු ශේෂ | 56,047,084 | ණයහිමි තහවුරු කිරීම්, ලිපි, සහ ණයහිමි ලේඛනය | සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතියෙන් පසු පියවර ගනු ලැබේ. | යාවත්කාලීනව ණයහිමි ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබා ගැනීම හා ලේඛන නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |

ගෝමරන්කඩුවෙල
මුන්නම්පොඩිවෙඩ්ඩායි
පුල්මුඩෙයි

**1.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

| **සභාව/ කාරක** | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශ** |
|---|---|---|---|---|
| 2000 අංක 46 දරන **ගොවිජන සංවර්ධන පනත** | | | | |
| කිලිවෙඩ්ඩි<br>කින්නියා<br>කුච්චවේලි<br>මුල්ලිපොතාන<br>කුරින්චන්කර්නි<br>මුතූර්<br>නිලාවේලි<br>සාම්පූර්<br>සේරුවිල<br>තම්පලකාමම්<br>තෝප්පූර්<br>උප්පුවේලි<br>එච්චලම්පත්රු<br>මුන්නම්පොඩිවෙඩ්ඩායි<br>පුල්මුඩෙයි | 43 (9) වගන්තිය | වසර දෙකකට වැඩි කාලයක සිට වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | වත්මන් වර්ෂයේ ගොවි සංවිධානයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

(අ) සමාලෝචිත වර්ෂය තුළ, ගොවිජන සංවර්ධන සභා 22 හි මෙහෙයුම් ප්‍රතිඵලය, වියදම ඉක්මවූ ආදායම රු.1,262,775 ක් විය. ඊට අනුරූපීව, පසුගිය වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.28,828,016 විය. ඒ අනුව මූල්‍ය කාර්ය සාධනය රු.27,565,241 කින් අඩු වී ඇත. සභාවල මෙහෙයුම් ආදායම අඩුවීම ඊට ප්‍රධානතම හේතුව විය.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ වියදම් ඉක්මවා ආදායමක් සහිත ගොවිජන සංවර්ධන බැංකු 22 හි මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,295,068 ක් විය. ඊට අනුරූපීව පෙර වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.1,117,975 කි. ඒ අනුව මූල්‍ය කාර්ය සාධනය රු.177,095 කින් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය කළමනාකරණය

| සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| මුතූර් මුල්ලිපොතානේ පුල්මුඩෙයි මුන්නම්පොඩිවෙඩ්ඩායි උප්පුවේලි | සමාලෝචිත වර්ෂය අවසානයේ එකතුව රු.7,576,959 ක් සභාව විසින් ඉතුරුම් සහ ජංගම ගිණුම්වල තැම්පත් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | සභාවේ අතිරික්ත මුදල් නිසි ආකාරයෙන් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමණාකරන අකාර්යක්ෂමතා

| | සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කින්නියා කුරින්චන්කර්නි සේරුවිල | පසුගිය සහ සමාලෝචිත වර්ෂවල කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් සභාවට ලැබුණු පැමිණිලි අයදුම්පත් 1085ක් සම්බන්ධයෙන් අදාළ නිලධාරියා විසින් පියවර ගෙන නොතිබුණි. පැමිණිලි අයදුම්පත් තවමත් විභාග වෙමින් පවතී. | පරීක්ෂණ අවසන් කිරීමට සැලසුම් සකස් කරන ලදී. | පැමිණිලි ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් නියමිත වේලාවට පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුන්නම්පොඩිවෙඩ්ඩායි | රු.279,358 වැය කරමින් ගොවිජන සංවර්ධන සභාව විසින් 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ආදර්ශ කෘෂිකර්ම උද්‍යානය ව්‍යාපෘතිය වසර 6කට වැඩි කාලයක් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල නිශ්කාර්ය වී ඇත. | දිගුකාලීන ආයෝජනයේ භෞතික අනුකූලතාවය තහවුරු කෙරෙන අතර, එයින් ආදායමක් උපයා ගැනීමට කටයුතු කරනු ලැබේ. | දිගුකාලීන ආයෝජනයේ භෞතික අනුකූලතාවය තහවුරු කර එමඟින් ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | උප්පුවේලි | ගොවිජන සංවර්ධන සභාවේ පරිපාලන බල ප්‍රදේශය තුළ අක්කර 4,217.5 ක උස්බිම, උස්බිම් ඉඩම් ලේඛනයේ ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.. | මෙම වසර අවසන් වන විට උස්බිම ලියාපදිංචි කිරීමට කටයුතු කරන අතර, යාවත්කාලීන තොරතුරු තහවුරු කිරීමෙන් පසු අදාළ ක්‍රමවේදය භාවිත කරමින් අක්කර බදු අයකර ගැනීමට නියමිතය. | අක්කර බදු ලේඛනය හෝ මාර්ගගත දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තම්පලකාමම් | මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇති රු.2,993,817 ක් වටිනා දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ උපලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | දේපල, පිරියත සහ උපකරණ උපලේඛනය මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතුය. |
| (ඉ) | ගෝමරන්කඩුවෙල | කෘෂිකාර්මික තොරතුරු ගොවීන් වෙත බෙදා හැරීම සඳහා වූ ඒකාබද්ධ කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.272,524 ක් වටිනා රූපවාහිනියක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, එය අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | සුදුසු පියවර ගනු ලබන අතර, ඉන් පසුව, එය පෙන්වීමට පියවර ගනු ලැබේ. | රූපවාහිනිය අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගෝමරන්කඩුවෙල | පසුගිය වසරේ ගොවීන්ට මුදලට අලෙවි කිරීම සඳහා ජාතික පොහොර සමාගමෙන් කිලෝග්‍රෑම් 50ක් බරැති රු.5,450,000ක වටිනාකමකින් යුත් TSP පොහොර බෑග් 545ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, ඒවා ගබඩා තුළ නිෂ්කාර්යව පවතී. | 2023 මහ කන්නයේ දී ඒවා විකිණීමට කටයුතු කරනවා. | ගොවීන්ට විකිණීමට හෝ නැවත පොහොර සමාගමට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ගෝමරන්කඩුවෙල | සමාලෝචිත වර්ෂය තුළ රු.162,000ක් වටිනා පොහොර මලු 90 ක් සශ්‍රිකා ලංකා පෞද්ගලික සමාගමෙන් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, ඒවා විකුණා නැති අතර හානි වී තිබුණි. | මෙම අයිතම ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා සහකාර කොමසාරිස් වෙත යවා ඇත. | සභාවට සිදුවූ හානිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ගෝමරන්කඩුවෙල | ගොවිජන සංවර්ධන සභාවේ මුළු ආදායම හා වියදම පිළිවෙළින් රු.36,803,656 සහ රු.37,400,709 ක් විය. එහෙත් ආදායම් වියදම් පාලන ලේඛනය ගොවිජන | ලේඛනය විධිමත්ව පවත්වාගෙන යන ලෙසට අදාළ නිලධාරියාට උපදෙස් ලබා දී ඇත. | ආදායම් සහ වියදම් පාලන ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

සංවර්ධන සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | තම්පලකාමම් එච්චලම්පත්රු | 2020 සහ 2021 වර්ෂවල ගොවිජන සංවර්ධන සභාවට කාබනික දියර පොහොර ලීටර් 2,370ක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, ඒවා විකිණීමකින් තොරව ගබඩාවල නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ගබඩාවේ ඇති තොග විකිණීමට හෝ සැපයුම්කරුවන් වෙත නැවත ලබා දීමට පියවර ගත යුතුය. |
| (ආ) | තම්පලකාමම් | ගොවිජන සංවර්ධන සභාව විසින් ඉඩම් සඳහා හිමිකම් ලේඛන තහවුරු කිරීමකින් තොරව කුඹුරු අක්කර 807ක් කුඹුරු ඉඩම් ලේඛනයේ ලියාපදිංචිකර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ඉඩම් අයිතිය පිළිබඳ ලියවිලි තහවුරු කර ගැනීමෙන් පසු කුඹුරු ඉඩම් ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගෝමරන්කඩුවෙල | 2018 වර්ෂයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් රු.616,627 ක ණය මුදලක් යටතේ මිලි ලීටර් 500 සිට ලීටර් 1 දක්වා දියර පොහොර බෝතල් 1,051ක් බෙදා හැර තිබුණි. කෙසේ වෙතත්, ඒවා විකුණා නොමැති අතර කල් ඉකුත් වී ගබඩාවේ පවතී. | මෙම අයිතම ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා සහකාර කොමසාරිස් වෙත යවා ඇත. | මෙම කල් ඉකුත් වූ පොහොර ගබඩාවෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ

| | සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කුච්චවේලි<br>මුල්ලිපොත්තානේ<br>කුන්නම්පොඩිවැඩ්ඩයි<br>උප්පුවේලි<br>තම්පලකාමම්<br>පුල්මුඩෙයි<br>කිලිවෙඩ්ඩි | කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරීමට සහ ශාක රෝග පාලනය අවම කිරීම සඳහා නැගෙනහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් විදුලි ඉසින යන්ත්‍ර 145 ක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඒවා අපේක්ෂිත | 2023 දී විදුලි ඉසින යන්ත්‍ර භාවිත කිරීමට කටයුතු කරනු ලැබේ. | විදුලි ඉසින යන්ත්‍ර අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කින්නියා<br>සේරුවිල<br>කුරින්වන්කර්නි | අරමුණු සඳහා භාවිතා කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | |
| (ආ) | කින්නියා<br>කුච්චවේලි<br>මුන්නම්පොඩිවෙඩ්ඩායි<br>සේරුවිල<br>උප්පුවේලි | ට්‍රැක්ටර් 05ක් අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව එම ට්‍රැක්ටර්වලින් කුලී ආදායම අහිමි වී තිබුණි. | මේවා භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින අතර ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. | ඒවා විකිණීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කින්නියා<br>සේරුවිල<br>කුරින්වන්කර්නි | ගොවිජන සංවර්ධන සභාවේ වාන් රෝද 06 ක් සහ තණකොළ කපන යන්ත්‍ර 09 ක් අලුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි | එම යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කර ගොවීන්ට කුලියට දීමෙන් ආදායම් උපයා ගැනීමට කටයුතු කරනු ලැබේ. | යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මුතූර්<br>පුල්මුඩෙයි<br>සම්පල්තිව්<br>තම්පලකාමම්<br>එච්චලම්පත්රු | පෙර සහ සමාලෝචිත වර්ෂවල දී ගොවිජන සංවර්ධන සභාවට පරිත්‍යාග වශයෙන් දියර පොහොර ලීටර් 21,982 ක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, ඒවා විකිණීමකින් හෝ භාවිතයකින් තොරව තබා ඇති අතර වසරකට වැඩි කාලයක් ඇතුළත හා පිටත නිශ්කාර්යව ගබඩා කර තබා ඇත. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | විකිණීමට හෝ සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| කිලිවෙඩ්ඩි<br>කින්නියා<br>කුච්චවේලි<br>මුල්ලිපොතානේ<br>කුරින්වන්කර්නි<br>මුතූර්<br>නිලාවේලි<br>සාම්පූර්<br>සේරුවිල<br>තම්පලකාමම්<br>තෝප්පූර්<br>උප්පුවේලි | සංවර්ධන නිලධාරීන් 46ක් අතිරික්තව සිටින අතර, ගොවිජන සංවර්ධන නිලධාරීන් 15ක්, ගොවිජන පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් 81ක්, මුරකරුවන් 2ක් සහ කාර්යාල සහයකවරු 3ක් පුරප්පාඩු වී තිබුණි. | මානව සම්පත් තොරතුරු දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. | මානව සම්පත් අතිරික්තය හා පුරප්පාඩු අවම කළ යුතුය. |

එච්චලම්පතු
ගෝමරන්කඩුවෙල
මුන්නම්පොඩිවෙඩ්ඩායි
පුල්මුඩෙයි
අග්බෝපුර්
කන්තලේ
වැන්-ඇල
පදවිශ්‍රීපුර
පන්කුලම්

**04.** **ගොවිජන බැංකුව**

| | සභාව/ සභා | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුල්ලිපොතාන<br>කුර්න්වන්කර්නි<br>සාම්පූර්<br>සේරුවිල<br>තම්පලකාමම්<br>ගෝමරන්කඩුවෙල<br>පුල්මුඩෙයි | පෙර සහ සමාලෝචිත වර්ෂවලදී ගොවීන් 237 දෙනෙකුට කෘෂිකාර්මික ණය ලබා දී ඇත. ගිවිසුම් කාලය අවසන් වූ පසුවද, පොලී ඇතුළුව ණය ශේෂය රු.8,589,167 ක් අයකර ගැනීමට ඉතිරිව ඇත. කෙසේ වෙතත් එම ණය මුදල අයකර ගැනීමට කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි. | ගොවීන්ගේ ණය ශේෂයන් සඳහා සමථ මණ්ඩලය මගින් උපදෙස් දී ඇති ශේෂය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඉතිරි ණය හා ණය පොලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගෝමරන්කඩුවෙල | සමාලෝචිත වර්ෂය තුළ ගොවීන් 94 දෙනෙකු සඳහා කෘෂිකාර්මික ණය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ගොවීන්ගේ ණයවලට අදාළ ලියකියවිලි 6ක් ලැබී නොතිබූ අතර, ණය අයදුම්පත් නිසි පරිදි ගොනු කර නොතිබුණද, ණය ලබා දී තිබුණි. | ගොවි බැංකුවේ නිලධාරීන් ගිණුම්කරණය පිළිබඳ අඩු දැනුමින් යුක්තය. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛන නිසි පරිදි සම්පූර්ණකර නොතිබුණි. කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ පූර්ණ අධීක්ෂණය යටතේ වූ අංශයේ වගකිවයුතු නිලධාරීන් විසින් අනුමැතිය ලබා දීමෙන් පසු ණය ලබාදීමට කටයුතු කරනු ලැබේ. | නිසි ලිපි ලේඛන සමඟ ණය ලබා දීම සඳහා සියලු නීතිමය අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගෝමරන්කඩුවෙල | පෙර වර්ෂ සහ සමාලෝචිත වසර සඳහා ගොවිජන බැංකු මෙහෙයුම් සහ ගණුදෙනු පිළිබඳ ලේඛනගතකරනය සඳහා ණය ලේඛනය, ඉතුරුම් ගිණුම් උප ලේඛනය, කුඩා කණ්ඩායම් ඉතුරුම් ගිණුම් උප ලේඛනය, | 2023 දී අදාළ නිලධාරීන්ට පුහුණුව ලබාදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොවිජන බැංකුවට අදාළ ලිපි ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අනිවාර්ය ඉතුරුම් ගිණුම් උප ලේඛනය, කොටස් ගිණුම් උප ලේඛනය හා ඉතිරි කිරීමේ ගිණුම් උප ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කිලිවෙඩ්ඩි<br>කින්නියා<br>කුච්චවේලි<br>මුල්ලිපොතානේ<br>කුරින්චන්කර්නි<br>මුතූර්<br>නිලාවේලි<br>සාම්පූර්<br>උප්පුවේලි<br>එඩ්වලම්පත්රු<br>ගෝමරන්කඩුවෙල<br>මුන්නම්පොඩිවැඩ්ඩයි<br>පුල්මුඩෙයි | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 ඔක්තෝබර් 08 දිනැති අංක 09/2020 සහ 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන මූල්‍ය පාලනය සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් වූ ගොවිජන බැංකු කළමනාකාරිත්වයේ චක්‍රලේඛවලට අනුව, බැංකුව සිය මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා කොටස් හිමියන් සහ තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව වැඩි කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ කොටස් හිමියන්ගේ සහ තැන්පත්කරුවන්ගේ සහභාගීත්වය වැඩිදියුණු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරියේදී කොටස් හිමියන් සහ තැන්පත්කරුවන් සහභාගීත්වයට කටයුතු කරනු ලැබේ. | ගොවිජන බැංකුවේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | කිලිවෙඩ්ඩි<br>කින්නියා<br>කුච්චවේලි<br>මුල්ලිපොතානේ<br>කුරින්චන්කර්නි<br>මුතූර්<br>නිලාවේලි<br>සාම්පූර්<br>සේරුවිල<br>තම්පලකාමම්<br>තෝප්පූර්<br>උප්පුවේලි<br>එච්චලම්පත්රු<br>ගෝමරන්කඩුවෙල<br>මුන්නම්පොඩිවෙඩ්ඩායි<br>පුල්මුඩෙයි | ඉහත සඳහන් චක්‍රලේඛයේ 2.6.3 වගන්තියට අනුව සියලුම ලියාපදිංචි ගොවිජන සංවර්ධන සමිති විසින් ඉතුරුම් ගිණුමක් ආරම්භ කර සියලු ගනුදෙනු එම ගිණුම හරහා සිදු කළ යුතුය. නමුත් ඒ අනුව ක්‍රියාමාර්ගය ගෙන නොතිබුණි.. | ඉදිරියේදී සියලුම ගනුදෙනු ගොවිජන බැංකු ගිණුම හරහා සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඉතුරුම් ගිණුමක් විවෘත කර එමඟින් කටයුතු සිදු කළ යුතුය. |